


# ආජීව අෂ්ටමක ශීලයෙන් දිවි සරු කර ගනිමු

මේ ලෝකයේ බොහෝ සත්ත්වයෝ සිටිති. අපට පෙනෙන මෙන් ම නොපෙනෙන සත්ත්වයෝ ද බොහෝ වෙති. මිනිසා ද සත්ත්වයෙකි. අප අවට පරිසරයේ දකින සත්ත්වයන් දෙස මඳක් විමසිල්ලෙන් බලන්න. මිනිසා ද සතුන්ට බොහෝ සෙයින් සමාන බවක් දක්වයි. මිනිස්සු ජීවත් වීම සඳහා ආහාර ගනිති. අනෙකුත් සත්ත්වයෝ ද ජීවත් වීම පිණිස ආහාර ගනිති. අපි දවසේ වෙහෙස නිවීම පිණිස විඩා හරිමු; නිදා ගනිමු; ආරක්ෂාව අපේක්ෂා කරමු. සත්ත්වයෝ ද විඩා හරිති; නිදා ගනිති; අපි දඬුවමට මෙන් ම මරණයට ද බියක් දක්වමු. සත්ත්වයෝ ද දඬුවමටත්, මරණයටත් බිය දක්වති; ආරක්ෂාව අපේක්ෂා කරති. සත්ත්වයෝ තම ප්‍රජාව බෝ කිරීම සිදුකරති. මිනිසා ද සිය ප්‍රජාව බෝ කිරීම සිදු කරයි.



මිනිසාත් සත්ත්වයාත් අතර වෙනස කුමක් ද? මිනිසාට ආගමක් ඇත. සත්ත්වයන්ට ආගමක් නැත. සත්ත්වයින් ඉගෙන ගන්නේ නැත. මිනිසා අධ්‍යාපනය ලබයි. සත්ත්වයෝ ගුණ යහපත්කම් නොදනිති. මිනිස්සු ගුණයහපත්කම් දනිති. සත්ත්වයෝ දෙමාපියන්ට නොසලකති. අපි දෙමාපියන්ට සලකන්නෙමු. මේ අනුව අපට පෙනී යන කරුණ නම් සත්ත්වයන්ට සදාචාර ධර්ම නැත. අපට සදාචාර ධර්ම ඇත. සදාචාර ධර්ම නොසලකා හරින්නාත් තිරිසනාත් අතර වෙනසක් නැති බව අප තේරුම් ගත යුතු නොවේ ද?

අප ජන සමාජයේ යහපැවැත්මට මහත් සේ උපකාර වන දෙයකි ආගම. විශේෂයෙන් ශ්‍රී ලාංකීය ජන සමාජය පෝෂණය වී ඇත්තේ බුදු දහම තුළිනි. අපේ සංස්කෘතිය, අපේ සාරධර්ම, අපේ ගතිපැවතුම්, අපේකම ආදී සෑම දෙයකට ම මූලික වී ඇත්තේ බුදු දහමයි. රජයේ හෝ පෞද්ගලික ආයතනයක යහපැවැත්ම උදෙසා සකස් කළ හෝ සම්මත වූ ආචාර ධර්ම පද්ධතියක් ඇත. පාසල්, දහම් පාසල් ආදී දරුවන් සිටින තැන්වල ද සාරධර්ම ක්‍රියාත්මක වේ. ගොවියා, කම්මල්කරුවා, කම්කරුවා, කරණවෑමියා, වෛද්‍යවරයා, ඉංජිනේරුවා, ගුරුවරයා, වෙළෙන්දා ආදී සෑම දෙනාට ම ආවේණික වූ සම්මත සාරධර්ම පද්ධති ඇත. කණ්ඩායමෙන් කණ්ඩායමට බොහෝ සාරධර්ම වෙනස් වන අතර සියල්ලන්ට ම පොදු සාරධර්ම ද ඇත. මේවා ඉක්ම යන්නා සමාජයේ නින්දාවට භාජනය වෙයි. සමාජයේ මිනිස්සු ඒ තැනැත්තා පිළිකුල් කරති; ඔහුට දොස් කියති; සමාජයෙන් කොන් කරති.

බුදුරජාණන් වහන්සේ විසින් ගිහියන්ට හා පැවිද්දන්ට වෙන් වෙන් ව සිල්පද දක්වා ඇත. ඒ අතර ගිහියන් වන අපට නිත්‍ය සීලය ලෙස පංච සීලයත්, ඊට අමතර ව ආජීව අෂ්ටමක සීලයත් සමාදන්විය හැකි ය. පොහෝ දින වැනි විශේෂ අවස්ථාවක අෂ්ටාංග සීලය හෝ ගිහි දස සීලය ද සමාදන් වීමේ හැකියාව ඇත. සිල් පද ආරක්ෂා කිරීම බෞද්ධ අපට පමණක් නොව ලෝකයේ කාටත් යහපත් දිවිපෙවෙතක් ගෙවීමට උපකාර වේ. අප නිතර සමාදන් වෙන සිල්පද පහට අමතර ව ඇතැම් අය ආජීව අෂ්ටමක සීලය සමාදන් වන අවස්ථා ද ඇත. ආජීව අෂ්ටමක සීලය ද අප ජීවිතයට හුරුකර ගැනීම වැදගත් වේ.

1. පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
2. අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
3. කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
4. මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
5. පිසුණාවාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
6. ඵරුසාවාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
7. සම්ඵප්පලාපා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
8. මිච්ඡා ආජීවා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

### 1. පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

කෙනෙකු සිල් රැකීම සිදු කරන්නේ පෞද්ගලික ව ය. එහෙත් එයින් සමාජයට ම වන්නේ ඉමහත් සේවයකි. පර පණ නැසීමෙන් වෙන්වීමේ සිකපදය රැකීමෙන් කෙනෙකු සිල් පදයක් රකිනවා පමණක් නොව අවට සමාජයේ සිටින සියලු සත්ත්වයන්ගේ ජීවිත සුරැකීම ද සිදු වේ. සියලු සත්ත්වයන්ට මරණ බියෙන් තොරව ජීවත් වීමේ හැකියාව ද එයින් හිමි වේ. අද ලෝකයේ බොහෝ දෙනෙක් මානව හිමිකම් ගැන කතා කරති. බුදු දහම මානව හිමිකම් ගැන පමණක් නොව සියලු සත්ත්ව ප්‍රජාවේ ම හිමිකම් ගැන කතා කරයි. එය සුරැකීමේ වැදගත්කම පහදා දෙයි.

### 2. අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

කෙනෙකු සොරකම් කරන්නේ තවත් කෙනෙකුගේ දෙයකි. සොරකමින් වැළකෙනවා යනු තවත් කෙනෙකුගේ දෙයක් ආරක්ෂා වීමයි. එයින් සමාජයේ මිනිසුන්ට සොර බිය නොමැතිව ජීවත් වීමේ හැකියාව ලබාදෙයි. තමන්ගේ වස්තුව සුරක්ෂිත ව තබා ගැනීමේ හැකියාව එයින් හිමි වේ. මම සොරකම් නොකිරීමේ ආනිසංස දනිමි. එය අන්‍යයන්ට ද කියාදෙමි. මා මෙන් ම අන්‍යයන් ද සොරකමට අප්‍රිය නිසා මම ද එයින් වැළකෙමි.

### 3. කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

තෙවන සිකපදය ද එසේ ම ය. එය යහපත් පවුල් ජීවිතයක් ගෙවීමට දායකත්වය සපයනවා නොවේ ද? කිසිවෙක් තම භාර්යාව හෝ ස්වාමි පුරුෂයා වෙනත් පුරුෂයෙකු හෝ කාන්තාවක සමග අසම්මත සම්බන්ධතාවක්

පවත්වනවාට කැමැති නොවෙති. එය ඕනෑම කෙනෙකුට පොදු ධර්මතාවකි. මෙසේ සිතා අප තෙවන සිකපදය රැකීමෙන් සමාජයට යහපතක් සිදු වේ. එයින් සමාජයේ එකිනෙකා කෙරෙහි ඇති විශ්වාසය රැකෙනවා පමණක් නොව නොයෙකුත් රෝග පීඩාදිය සෑදීම පවා වැළකෙනවා ඇත.

## 4. මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

සිව් වන සිකපදය රැකීමෙන් සමාජයේ තවත් කෙනෙකු රැවටීමෙන් වෙන්වෙනවා පමණක් නොව සමාජයේ එකිනෙකා කෙරෙහි ඇති වන විශ්වාසය ද ඉහළ යයි. යමෙකු බොරු කියා මා රවටන්නේ නම් මා එයට කැමැති නැත. එසේ ම මා බොරු කියා අන්‍යයන් රවටනවාට ඔවුන් ද කැමැති නැත. මා රවටනවාට මම ප්‍රිය නොවෙමි. අන්‍යයෝ ද ඒ අය රවටනවාට ප්‍රිය නොවෙති. බොරු කීමේ විපාකත් බොරු නොකීමේ ආනිසංසත් මම හොඳින් දනිමි. අන්‍යයන්ට ද කියා දෙමි.

## 5. පිසුණාවාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

පස් වන ශික්ෂා පදය තුළින් පිසුණුබස් කීම හෙවත් කේලාම් කීමෙන් වෙන්වීමට උත්සාහ ගනී. බුදුරජාණන් වහන්සේගේ කාලයේ සිටි අහිංසක නැමැති දරුවා අංගුලිමාල නම් මහා දාමරිකයෙකු වූයේ කේලමේ ඇති භයංකාර කම නිසා බව අප අමුතුවෙන් කිවයුතු නොවේ. යමෙකු කේලාම් කියා මාගේ මිත්‍රයින් හා මා භේද කරනවාට මා කැමැති නැත. එසේ ම අන් අය ද කේලාම් කියා තමන් භේද කරනවාට කැමැති නැත. කේලාම් කීමේ විපාක දන්නා මම අන්‍යයන් ද එයින් වළකමි.

## 6. ඵරුසාවාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි.


ඵරුසාවාචා යනු නපුරු වචනයි. රළු වචන, පරුෂ වචන, කුණු හරුප, කැත වචන යනාදී වශයෙන් හැඳින්වෙන්නේ ද මේවායි. අප දරුවන් වශයෙන් අන් අයගේ සිත රිදෙන නරක නපුරු වචන කිසි දා කතා නොකළ යුතු ය. එය යහපත් ධර්මතාවකි. ප්‍රිය වචන කතා කරන කෙනාට සමාජයේ බොහෝ දෙනා ආදරය කරති; ප්‍රශංසා කරති. නපුරු වචන කියන අය පිළිකුල් කෙරෙති. ප්‍රිය වචන කීමේ වැදගත්කම දන්නා මම අන්‍යයන් ද ප්‍රිය වචන කතා කිරීමට පොළඹවමි.

## 7. සම්ඵප්පලාපා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

සම්ඵප්පලාප යනු හිස් වචනයි. අපගේ මෙලොව දියුණුවට හෝ පරලොව දියුණුවට හෝ හේතු නොවන, කාලය කා දමන, වැඩකට නැති දේ හිස් වචන ලෙස හඳුන්වමු. බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවකයන්ට දේශනා කළේ කතා කරන්නේ නම් ධාර්මික කතාවක නිරත වන ලෙස ද. එසේ නොමැති නම් ආර්ය උතුමන් වහන්සේලා මෙන් නිශ්ශබ්ද ව සිටීම වැදගත් බව ද පෙන්වා දුන්හ. අප ද දරුවන් ලෙස පාසලේ දී හෝ නිවසේ දී හෝ වැඩකට ඇති දෙයක්, තම ජීවිතය සාර්ථක කරගත හැකි දෙයක්, සමාජයට වැඩදායක දෙයක්, අධ්‍යාපනයට වැදගත් දෙයක් කතා කරන්නේ නම් කොපමණ අගනේ ද? අප හුරුකරගත යුත්තේ ද එයයි.

## 8. මිච්ඡා ආජීවා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

අවසාන සිල් පදයෙන් පෙන්වා දෙන්නේ මිච්ඡා ආජීවයෙන් තොරවීමයි. මිච්ඡා යනු නිවැරැදි නොවූ යන්නයි. ආජීව යනු දිවිපැවැත්මයි. මිච්ඡා ආජීවය යනු වැරැදි දිවිපෙවෙතයි. අප වැරැදි දිවිපෙවෙතින් ඈත් ව නිවැරැදි දිවිපෙවෙතක් ගත කිරීම මෙයින් අවධාරණය කෙරෙයි. අද සමාජයේ ඇතැමුන් සිතන්නේ අප කෙසේ හෝ ජීවත් විය යුතු ය කියා ය. එය වැරැදි මතයකි. අප කෙසේ හෝ ජීවත් වීමට නොව හොඳින් ජීවත් වීමට අදිටන් කරගත යුතු ය. තමන් කරන්නේ වෙළෙඳාමක් විය හැකි ය. ගොවිතැනක් විය හැකි ය. රජයේ හෝ පෞද්ගලික ආයතනයක රැකියාවක් විය හැකි ය. මේ සෑම තැනක ම හොඳ හා නරක සිදුකිරීමේ හැකියාව අපට ඇත. අප මේ දෙක වෙන්කොට අවබෝධ කොටගෙන නරක ඉවත් කර හොඳ දේ තෝරා ගැනීමට දක්ෂ විය යුතු ය.



## සාරාංශය

ජන සමාජයේ පෝෂණය සඳහා බෞද්ධ සාරධර්ම මහෝපකාරී වේ. එහි ප්‍රමුඛතම අංගයක් ලෙස පංච සීලය හා ආජීව අෂ්ඨමක සීලය හඳුන්වාදිය හැකි ය. එම ප්‍රතිපදා ඔස්සේ තම ආධ්‍යාත්මික සංවර්ධනය ගොඩනගා ගන්නේ නම් එය පුද්ගල හා සමාජ සුභ සිද්ධිය සඳහා මහෝපකාරී වේ. හොඳ නරක තෝරා බේරාගත් සමාජයක් තුළ නිවැරැදි දිවිපැවැත්මක් ඇති ව ජීවත් වීම බුදු සමය අනුමත කරන පිළිවෙතයි.



## ක්‍රියාකාරකම

1. මිනිසා සහ සත්ත්වයන් සමාන වන්නේ හා වෙනස් වන්නේ කුමන ගති ලක්ෂණවලින් දැයි පැහැදිලි කරන්න.

2. ආජීව අෂ්ටමක සීලයට අයත් ශික්ෂා පද නිවැරැදි උච්චාරණයෙන් යුතු ව කටපාඩමෙන් කියන්න.

3. මිථ්‍යා ආජීවයෙන් වැළකීමෙන් සිදුවන සමාජීය යහපත පැහැදිලි කරමින් වාක්‍ය 5ක් ලියන්න.